
1

1.4 විශේෂාංග රූප සටහන

## බලපත්‍රලාභී වාණිජ බැංකු මගින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය පරිණත කාලය අනුව ව්‍යාප්තිය

(බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය සහ අත්තිකාරම් පිළිබඳ මාසික සමීක්ෂණය අනුව)

### 2025 වසර තුළ පරිණත කාල අනුව ණය ප්‍රසාරණය (රුපියල් බිලියන)




සටහන්: 1. එක් එක් අංශයේ වාර්ෂික ණය ප්‍රසාරණය සහ සමස්ත ණය ප්‍රසාරණයට දක්වා ඇති දායකත්වය වරහන් තුළ දක්වා ඇත.
2. 2025 වර්ෂය අවසානයේ පෞද්ගලික අංශයේ ණය තොගය ප්‍රධාන අංශ අනුව බෙදී යෑම පහත පරිදි වේ: කෘෂිකර්මාන්තය (9%), කර්මාන්ත (38%), සේවා (31%), සහ පෞද්ගලික ණය සහ අත්තිකාරම් (22%). එම කාලය තුළ පරිණත වීමේ කාලය අනුව ණය ව්‍යාප්ත වීම, කෙටි කාලීන (42%), මැදි කාලීන (22%) සහ දිගු කාලීන (36%) ණය වලින් සමන්විත විය.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

2025 වසර තුළ දී දක්නට ලැබූ පෞද්ගලික අංශය වෙත ලබාදුන් ණය ප්‍රසාරණය ආර්ථිකයෙහි ප්‍රධාන අංශ අතර බොහෝ දුරට පුළුල් ලෙස ව්‍යාප්ත විය. මෙයින් සේවා අංශයෙන් ලබාගත් ණය සහ පෞද්ගලික ණය සහ අත්තිකාරම් හරහා සිදු වූ ණය ප්‍රසාරණයෙන් වැඩි ප්‍රමාණයක් කෙටි කාලීන ණය ලබා ගැනීම් මත පදනම් විය. මෙමගින් සේවා අංශයේ ව්‍යාපාරවල කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා වූ මූල්‍යන සම්පාදන අවශ්‍යතාවන්හි වැඩිවීම පිළිබිඹු කරයි. එපමණක් නොව, පරිභෝජන අවශ්‍යතා මෙන්ම, කෙටි කාලීන ද්‍රවශීලතා අවශ්‍යතා කළමනාකරණය කිරීම සඳහා ගෘහස්ථ අංශයේ ණය ගැනීම් ද ඉහළ ගොස් ඇත.

එසේ වුවද, කාර්මික අංශයේ ණය ප්‍රසාරණය ප්‍රධාන වශයෙන් දිගු කාලීන ණය මත පදනම් වී ඇති අතර, එමගින්, විශේෂයෙන්ම, ආර්ථික අර්බුදයෙන් පසු ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමේ අවධිය තුළ ප්‍රාග්ධන ආයෝජන සහ ව්‍යාපාර පුළුල් කිරීමේ ව්‍යාපෘති සඳහා ලබාගත් අරමුදල් ඉහළ යෑම පෙන්නුම් කරයි.

මේ අතර, කෘෂිකාර්මික හා ධීවර අංශයේ ණය ප්‍රසාරණය ප්‍රධාන වශයෙන්ම කෙටිකාලීන ණය මත පදනම් වී ඇති අතර, එමගින් කෘෂිකාර්මික නිෂ්පාදන ක්‍රියාවලියේ සෘතුමය ස්වභාවය මෙන්ම බීජ, පොහොර, ශ්‍රමය සහ අනෙකුත් වගා ආශ්‍රිත වියදම් සඳහා අදාළ මූල්‍යමය අවශ්‍යතා පිළිබිඹු කරයි.